# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 5 ශ්‍රේණිය - පරිසරය ( ඔක්තෝබර්-3 සතිය )

## 14 තේමාව - අපට කළහැකි වෙනස්කම්

❖ ක්‍රියාකාරකම 1

දුවේ, පුතේ, ඔබ පාසල් පැමිණිවිට දිනපතා උදෑසන ආගමික වතාවත් කළා මතක ද? අද සිට පුතා උදෙන් ම අවදි වී ආගමික වතාවත් කරන්න. ඔබ පාසලේ දී කළ පරිදි ශරීර සුවතා ක්‍රියාකාරකම් කරන්න. හැකිනම් සූර්ය නමස්කාරය ද සිදුකරන්න.

❖ ක්‍රියාකාරකම 2.

පුතේ ඔබේ නිවසේ හෝ නිවස අවට පරිසරයේ තෝරාගත් ස්ථානයක යම් සුන්දරත්වයක් ඇතිවන ආකාරයට වෙනස් කරන්න.



❖ ක්‍රියාකාරකම 3.

පුතේ ඔබේ නිවසේ පාවිච්චි කිරීමෙන් පසු ඉවත්කරන අපද්‍රව්‍ය (බැහැර කරන සියලුම දේ) වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කරන්න. (ප්ලාස්ටික්, රබර්, වීදුරු, පොලිතීන්, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආදී වශයෙන්) මේවා බැහැර කළයුත්තේ කෙසේද කියා නිවසේ අය සමඟ සාකච්ඡා කරන්න. (මේවා නිවෙස්වල පිළිස්සීම හෝ පරිසරයට මුසුකිරීම සිදු නොකළයුතු බවත්, එලෙස කිරීමෙන් තමන්ටත් අන් අයටත් සෞඛ්‍යමය හානි වගේම පරිසරයටත් හානි සිදුවන බව සාකච්ඡා කරන්න.)

- ඔබට අන්‍යයන් (පාසලේ හෝ පාසලින් පිටත) වෙනුවෙන් කළ හැකි උදවු 5ක් ලියන්න.